“හිරු උදාවන උතුම්ම දිනය ජුමුආ දිනයයි

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “හිරු උදාවන උතුම්ම දිනය ජුමුආ දිනයයි.
ආදම් මවනු ලැබුවේ එහිය. ස්වර්ගයට ඇතුළත් කරනු ලැබුවේ ද එහිය. ඉන් බැහැර කරනු
ලැබුවේ ද එහිය. අවසන් හෝරාව හට ගන්නේ ජුමුආ දිනක ය“
[صحيح] [رواه مسلم]

හිරු උදාවන උතුම්ම දිනය ජුමුආ දිනය බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දැනුම් දුන්හ. එදින සුවිශේෂී කරුණු නම්: සැබැවින්ම අල්ලාහ් එදින ආදම් (අලයිහිස් සලාම්) තුමාව මැව්වේය. ඔහුව එදින ස්වර්ගයට ඇතුළත් කළේය. එමෙන්ම එදින ඉන් බැහර කර මහපොළොවට යැව්වේය. ජුමුආ දිනයේ හැර අවසන් හෝරාව වෙනත් දිනක සිදු වන්නේ නැත.

https://sunnah.global/hadeeth/si/show/3711